නීතියෙන් දඬුවම් ලැබෙනා වරදක් වන ලිංගික අතවර සිදුවීම් වල බරපතල බව සැහැල්ලු කොට දක්වන සිරස්තල යෙදීම් සම්බන්ධයෙන් අප කිහිප විටක්ම සාකච්ඡා කර ඇත්තෙමු. එහිදී පාඨකයින් ලෙසින් අප නගන පැනය වන්නේ, ලිංගික අතවරයක් හෝ ලිංගික අපරාධයක් සම්බන්ධයෙන් එහි සැබෑ බරපතල භාවය සඳහන් නොකර සිරස්තල යෙදීම හෝ වාර්තා කිරීම මගින්, එවැනි වරදක් සාමාන්‍යකරණය නොවේ යැයි ඔබ සිතන්නේද?
මෙයට උදාහරණ ලෙසින්, මව්බිම පුවත්පතේ (07/09) එකම ලිංගික අතවර සිදුවීමක් පුවත් වාර්තාවන් දෙකක දැක්වී ඇති ආකාරය ගනිමු. එකම සිදුවීමක් ආවරණය කරනා මෙම පුවත් වාර්තාවන් දෙක එකම දිනයේදී, එකම පුවත්පතක පිටු දෙකක් තුළ පළවී තිබීමද විශේෂත්වයකි.
මෙම සිරස්තල දෙක සලකා බැලීමේදී වඩාත් යෝග්‍ය සිරස්තලය ලෙසින් ඔබ තෝරාගන්නේ කුමන සිරස්තලයද?
#MediaEthicsSL #lka #sinhalanews #Mawbima